# සාමාන්‍ය සමයේ විසිපස්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

සෙකරියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

සෙකරියා 2 : 1-5, 10-11

"නුඹලා සමඟ වාසය කරන පිණිස මම එන්නෙමි."

මා හිස ඔසවා බැලූවිට සිය අතේ මනින ලණුවක් ඇති මිනිසෙක් මට දර්ශනය විය. "ඔබ කොහේ යනවා දැ"යි මම ඔහුගෙන් ඇසීමි. "ජෙරුසලම මැන, එය කොපමණ දිග ද කියාත්, කොපමණ පළල ද කියාත් බලන පිණිස මම යමි"යි ඔහු පිළිතුරු දුන්නේය. එවිට මා සමඟ කතා කළ දූතයා පිටත්ව යනවාත්, වෙන දූතයෙකු ඔහුගේ පෙරමඟට එනවාත් මම දිටිමි. ඔහු පළමු දූතයාට මෙසේ කීය. "ඔබ දුව ගොස් අර තරුණයාට කතා කොට මෙසේ කියන්න. ජෙරුසලම පවුරකින් සීමා නොකළ හැකි නගරයක් වනු ඇත. මන්ද, එහි ජනගහණය ද ගව මහීෂයන් ද වැඩි වන්නට යන නිසා ය. මම ඒ වටා පවුරක් වෙමි. ඒ තුළ තේජාලංකාරයෙන් වැඩ සිටින්නෙමි"යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.

"සියොන් පුරගන, ප්‍රීතියෙන් ගී ගයන්න. මම නුඹලා සමඟ වාසය කරන පිණිස එන්නෙමි යි කියා සමිඳාණන් වහන්සේ වන මම කියමි. ඒ කාලයේ දී බොහෝ ජාතීහු සමිඳාණන් වහන්සේට එක් වී උන් වහන්සේගේ සෙනඟ වන්නෝ ය."

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ජෙරමියා 31 : 10 – 13

පිළිතුර: සමිඳාණෝ අප රැක ගන්නා සේක.

ගීය:

එම්බා ජාතිනි, සමිඳුන්ගේ වචනයට සවන් දී දුර බැහැර දිවයින්වල එය ප්‍රකාශ කරන්න. 'ඉශ්රායෙල් සෙනඟ විසිර වූ මම ඔවුන් රැස් කරන්නෙමි. එඬේරා තම රැළ රැකගන්න පරිදි මම ඔවුන් රැකගන්නෙමි'යි කියන්න.

ඉශ්රායෙල් සෙනඟට නිදහස දී, බලවත් ජාතීන්ගේ හස්තයෙන් මම ඔවුන් ගලවා ගතිමි. ඔව්හු පැමිණ සියොන් කන්ද මත ප්‍රීතියෙන් ගී ගයති.

එවිට තරුණියෝ ප්‍රීතියෙන් නටන්නෝ ය. තරුණයෝ ද මහල්ලෝ ද එක්ව ප්‍රීති වන්නෝ ය. මම ඔවුන්ගේ වැලපීම ප්‍රීතියට හරවන්නෙමි. ඔවුන් සනසා ඔවුන්ගේ දොම්නස සොම්නසට හරවන්නෙමි.

## සුබපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ස්වාමිනි, ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ වචනය පිළිගැන්මට අපගේ සිත් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපගේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මරණයේ බලය බිඳ දමා
ජීවනයත් අමරණීය භාවයත්, සුබ අස්න මගින් හෙළිකර වදාළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 9: 43-45

"මනුෂ්‍ය පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලබන සේක.."

ජේසුස් වහන්සේ සිදු කළ සියල්ල ගැන හැම දෙනාම පුදුම ව සිටිය දී, උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට "මා කියන දේ සාවධානව සිතට ගන්න, මනුෂ්‍ය පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලබන සේකැ"යි වදාළ සේක. එහෙත් ඔවුන්ට ඒ කීම අවබෝධ නොවීය. එය ඔවුන්ට නොවැටහෙන ලෙසින් සැඟවී තිබිණි. ඔව්හු ඒ කීම ගැන උන්වහන්සේගෙන් ඇසීමටත් බිය වූහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.